# සාහිත්‍ය හා ජනප්‍රවාදය තුළ හස්තියා

**ඩබ්.ඩබ්. සසිකා දමයන්ති***

ආසියානු හස්තියා වූ කලී ලොව අනෙකුත් හස්තීන්ට වඩා කැපී පෙනෙන තේජාන්විත දේහයක්, ජීවන රටාවක් මෙන්ම සමාජය තුළට ඒකාබද්ධ වීමක් දක්නට ලැබෙන අතර ජන ජීවිතය හා ආගම දහම තුළ ද බෙහෙවින් කැපී පෙනෙන සත්ත්ව කොට්ඨාසයක් ලෙසද හැඳින්විය හැකිය. එහෙයින් ආසියානු හස්තියා අප්‍රිකානු, ඔස්ට්‍රේලියානු, ඇමරිකානු ආදී හස්තීන්ට වඩා බෙහෙවින්ම සුවිශේෂී බව පරීක්ෂණ මගින් අනාවරණය වන අතර මිනිසාට වඩාත්ම සමීප වී ඇත්තේ ආසියානු හස්තියා බව සාහිත්‍ය හා ජනප්‍රවාද තුළින් ප්‍රකට වේ. මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ, සාහිත්‍ය හා ජනප්‍රවාදය තුළ හස්තියා යොදාගැනීම හා නිරූපණය පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීමයි.

සාහිත්‍ය හා ජනප්‍රවාදය තුළ හස්තියා සම්බන්ධ කරුණු විමසීමේදී පළමුව අප අවධානය යොමු වන්නේ ජාතක කතා සාහිත්‍යයට. ජාතක කතා සාහිත්‍ය තුළ හස්තියාගේ චර්යා රටාව, හස්තියාගේ නුවණ, ශක්තිය, නායකත්වය මෙන්ම ගුණ සම්පන්න බව චිත්තාකර්ෂණීය ලෙස නිරූපණය කිරීම තුළින් මානව චර්යා රටාවන්ගේ විවිධ පැතිකඩයන් අපූර්ව ලෙස පිළිබිඹු වේ. තවද මෙහිදී හස්තියාට ගෞරවයක් සහ පූජනීයත්වයක් ලබාදී තිබේ.

ජන කවි තුළ හස්තියා විවිධ ආකාරයෙන් නිරූපණය කර ඇත. විටෙක වන අලියාගෙන් බෝග වගාවන්ට සිදුවෙන හානි හේතුවෙන් ඔවුන් අලියා කෙරෙහි ක්‍රෝධයකින් ද විටක බියකින් ද පසුවන නමුත් විටෙක අලියා කෙරෙහි කරුණා බරිත ස්නේහයකින් යුක්තව සලකන ආකාරය ජන කවි තුළින් ප්‍රකට වේ. එපමණක් නොව ජන වහර සහ සාහිත්‍ය තුළ හස්තියාගේ නාමය 'උසස්' යන අර්ථ දනවන දේවල්වලට යොදාගෙන ඇත. එසේම ප්‍රස්තා පිරුළු, උපමා, රූපක, ආප්තෝපදේශවලදී හස්තියා සම්බන්ධ කර ඇති ආකාරය අපට බහුලව දැක ගත හැකිය.

හස්තියාගෙන් ලැබෙන සහාය මෙන්ම හස්තියාගේ ජීවන තොරතුරු වටා ගෙතුනු ගීත දක්නට ලැබේ. එපමණක් නොව මානව හැඟීම්වල ස්වභාවය එනම් ප්‍රේමය, දරාගැනීම ආදිය නිරූපණය කිරීමට හස්තියා යොදාගෙන ඇති ආකාරය අපූරුය.

අලියන්ටම ආවේණික නාදයක් මෙන්ම භාෂාවක් ද ඇත. එම භාෂාව පිළිබඳ හොඳ දැනීමක් ඇති පුද්ගල කොට්ඨාසයක් ඇත. මේ පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවක් කිරීමට බලාපොරොත්තු වෙයි.

ආසියානු හස්තියා වනයට පමණක් නොව මානව හදවතට මෙන්ම සාහිත්‍යයට බද්ධ වී ඇති ආකාරය සාහිත්‍ය හා ජනප්‍රවාද ඇසුරින් පුළුල් කතිකාවක් කිරීමට බලාපොරොත්තු වෙයි.

**මුඛ්‍ය වචන :- හස්තියා, සාහිත්‍ය, ජනප්‍රවාදය, අලියා, නිරූපණය**

---

***හින්දි භාෂා විශේෂවේදී තෙවන වසර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. ජයවර්ධනපුර.**